## ආයිත් පරිප්පු?

1 වන පිටුවෙන්

බලයේ සිටි කොටි ත්‍රස්තවාදීන් පියවරින් පියවර පරාජය කරමින් දිස්ත්‍රික් 7ක්ම රජයේ හමුදා අත්පත් කොට ගෙන ඇත. දැන් කොටි හමුදාවල බලය දිස්ත්‍රික්ක දෙකකට සීමාකර ඇති අතර රජයේ දැඩි ප්‍රහාර වලට ඔවුන් භාජනය කොට ඇත. කොටින් ඊට ප්‍රතිප්‍රහාර ගෙනගියද ඔවුන් නුදුරු අනාගතයේදීම පරාජය වනවා නියතය.

මේ සියළු කරුණු වලින් පෙන්වනුයේ ගරිල්ලා සටන් ව්‍යාපාර දේශපාලන මාර්ගවලින් මිස මිලිටරි මාර්ග වලින් කිසිසේත් බිඳලිය නොහැකිය යන මෙතෙක් පැවති ප්‍රබල දුර්මතය බිඳවැටීමය. තහවුරු වන්නේ ත්‍රස්තවාදය පරාජය කිරීමේ හොඳම සහ ප්‍රධානතම මාර්ගය නම් එය සටනින් බිඳදැමීම ය යන්නයි.

ඉහත සඳහන් දුර්මතය ආරම්භ වූයේ සුප්‍රසිද්ධ වියට්නාම් යුද්ධයේදී ඇමරිකන් හමුදා ලද අන්ත පරාජයේ ලැජ්ජාව වසා ගැනීමට එකල එම හමුදා සහ දේශපාලන නායකයින් දැක්වූ හේතු වශයෙන් සහ ඒවා සාධාරණය කිරීමට කළ උත්සාහය තුළිනි. වියට්නාම් යුද්ධය එක රාජ්‍යයකට සීමාවූ ත්‍රස්තවාදී ව්‍යාපාරයකට එරෙහිව ගෙනගිය යුද්ධයක් නොවේ. එය එවකට ලෝක බලවතුන් වූ ඇමරිකාම හා සෝවියට් දේශය අතරේ වූ සීතල යුද්ධයේම එක් කොටසකි. පසු කලෙක දී මෙම දුර්මතය වැරදි පැත්තෙන් අල්ලා ගත් සමහර දේශපාලන පණ්ඩිත යෝ ත්‍රස්තවාදය කෙසේවත් යුද්ධකර මැඩලිය නොහැකිය යන්න අළුත් න්‍යායක් ලෙස ගොඩනැගූහ.

ත්‍රස්තවාදීන් එම මහට බැසීමේ මූලික හේතුව, එනම් මුහුණ දී ඇති යම් දුක්ගැනවිලි (grievances) සොයා ඒවා නැතිකරලීමට ඔවුන් සමග සාකච්ඡාකිරීමෙන් ත්‍රස්තවාදය විසඳීමේ එකම මග ය යනු තවත් එවැනිම මුල්බැසගත් මතයකි.

නමුත් අද බොහෝ ත්‍රස්ත ව්‍යාපාරවල මූලික අරමුණ එවැනි සිය ජනකොටස්වල දුක්ගැනවිලිවලට පිළියම් ලැබීම නොව සම්පූර්ණ සහ නිරපේක්ෂ බලය ලබාගැනීමයි. ලංකාවේ කොටි ගෙනයන, අන් සියළු ද්‍රවිඩ දේශපාලන සංවිධාන විනාශකර දමා මුදුනාවීමට දැහලීම මෙයට හොඳම නිදසුනක් බව **Wall Street Journal** ලිපිය පෙන්වා දෙයි.

දේශපාලනයෙන් තොරව මිලිටරි විසඳුමක් මගින්ම පමණක් සමාජ ප්‍රශ්න විසඳීම මින් අදහස් නොකරන බවද එය පෙන්වා දෙයි.

✻ අවි බිමතබා සාකච්ඡාවට ඒමට අවංකවම ත්‍රස්තවාදීන් එකඟවුවහොත් එවිට සාකච්ඡා මගින් ප්‍රශ්න සාර්ථකව විසඳිය හැකිය යන්න එක් ප්‍රවේශයකි.

✻ ත්‍රස්තවිරෝධී මිලිටරි සටන ගෙනයන අතරම ත්‍රස්තවාදීන් අතරම මතුවන මතභේද, විෂමතා ආදිය උපායශීලී ලෙස උපරිම ප්‍රයෝජනයට ගැනීමෙන් ඔවුන් දුර්වල කොට පරාජයට පත්කරලීම තව ප්‍රවේශයකි. ලංකාවේ සහ ඉරාකයේ එවැනි දේ සාර්ථකව උපයෝගී කොට ගෙන ඇති බවද ඒ ලිපිය පවසයි.

✻ මෙසේ නොවන තැනක සාධාරණ ලෙස ප්‍රශ්න විසඳීමට සාකච්ඡාකිරීම ඇරඹිය යුත්තේ ත්‍රස්තයන් සම්පූර්ණයෙන්ම විනාශකිරීමෙන් පසුව පමණි.

මේ සියල්ලෙන් අවධාරණය කරන්නේ මෙයයි. එනම් ත්‍රස්තවාදය විනාශ කළ හැකිය. සාධාරණ ලෙස විසඳුමක් සඳහා ත්‍රස්තවාදය විනාශ කළ යුතුය යන්න ය.




**වඩමරච්චි මෙහෙයුමට නායකත්වය දුන් රණවිරුවෝ**

The commanders of **Operation Liberation** commonly known as **Vadamarachchi Operation**. *From left to right:* Lt Col. Vipul Boteju, Lt Col. Sarath Jayawardane, Col. Wijaya Wimalaratne, Brig. Denzil Kobbekaduwa and **Maj. Gotabhaya Rajapakse ( 1987 in Jaffna )**

## ඉන්දියාව නැවත හොල්මන් කිරීම සහ එහි පසුබිම

අප මුලදී සඳහන් කළ පරිදි ඉන්දියාව අපේ ප්‍රශ්නවලට නැවත අතපෙවීමේ වෑයමක් පසුගිය දෙසතිය තුළ පෙනෙන්නට ඇත. සති දෙකකට පමණ පෙර යම් සාකච්ඡා සඳහා පැය 36 කට ලංකාවට හදිසියේ පැමිණ ගිය ඉන්දීය නායක යින් තිදෙනා නම් ජාතික උපදේශක එම්. කේ. නාරායන්, විදේශ ලේකම් පී. ශිව් ශංකර් මෙනන් සහ ආරක්ෂක ලේකම් වීරේ සිං ය. දකුණු ආසියා ප්‍රදේශ රටවල ප්‍රධානම සංවිධානය වන සාක් **( SAARC )** සංවිධානයේ මේවර සමුළුව මෙම ජූලි 29 වෙනිදා සිට අගෝස්තු 23 දක්වා ලංකාවේ මහනුවරදී පැවැත්වීමට නියමිතය. දැනට ප්‍රකාශිත අන්දමට ඉන්දීය අගමැති මන්මෝහන් සිං මහතා එයට සහභාගිවීමට නියමි තය. ඉතින් ආරක්ෂක පියවරවල් ගැන සාකච්ඡා කිරීමට මෙවන් නිලධාරීන් පැමිණීම සාධාරණය. නමුත් ඔවුන් එම ගමනේදී හමුවූ අය සහ කළ සාකච්ඡා ගැන දැන් දැන් පලවන ආරංචි අනුව ඔවුන් එම සීමාවෙන් ඔබ්බට යෑමක ප්‍රයත්නයක් ගැන සාධාරණ සැකයක් මතුකරයි. ඔවුන් අපේ ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම් හා ත්‍රිවිධ හමුදාපතීන්ට අමතරව ද්‍රවිඩ දේශපාලනඥයින් කීප දෙනෙක්ද හමුවී සාකච්ඡා කර ඇත. එයට අමතරව මනෝ ගනේෂන් වැනි සැක කටයුතු (මෑතකදී සිය කොළඹ කාර්‍යා ලයේ කොටින් කීප දෙනෙකු සේවයේ යොදවා සිටියේයයි චෝදනා ලැබ සිටින) පුද්ගලයින්ද හමුවීම අර සමුළු ආරක්ෂා පියවර වල් ගැන පමණක් නොව නැවත අප රටේ ප්‍රශ්න වලට නොමනා ලෙස අතපොවන මං සෙවීමට ආ සෝදිසි ගමනක ස්වභාවය පෙන්වයි.

විශේෂයෙන් ඉන්දීය ආරංචි මාර්ගවලින් පෙනෙන අන්දමට මෙහි **(TNA)** ද්‍රවිඩ ජාතික සංවිධානයේ ප්‍රධානියා වන ආර්. සම්බන්ධන් මන්ත්‍රීවරයා සමග කරන ලද සාකච්ඡාවල විස්තර මෙම සැකය තහවුරු කරලයි. **TNA** යනු කොටින්ගේ තුවක්කු බලයෙන් ද්‍රවිඩ ප්‍රදේශවලින් ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවක් ලැබ, අපේ පාර්ලිමේන්තුවට අනියමින් රිංගාගත්, කොටින් ගේ බළල් අත් යයි කිවහැකි කොටසකි. මොවුන් අපේ පාර්ලිමේන්තුවේ සිටියද අදත් උතුරු නැගණහිර වෙන් කිරීම නිල වශයෙන් නොපිළිගන්නා පිරිසකි.

සම්බන්ධන් මේ ප්‍රශ්නය මේ ඉන්දීය නියෝජිතයින් සමග සාකච්ඡාවේදී මතු කර ඇත. මේ ගැන ඒ නියෝජිත නායක සහ ආරක්ෂක උපදේශන නාරායන් ඒ සංකල්පය තවමත් ඉන්දියාව පැත්තෙන් පිළිගැනෙන බවත්, අගමැති මන්මෝහන් සිං කීප වාරයක් ම ලංකාවේ ද්‍රවිඩ භාෂාමය ප්‍රදේශයක **( Tamil Liguistic Region)** වැදගත්කම සඳහන්කර ඇති බවත් කියමින් ඒ ගැන ඉන්දීය පැත්තෙන් සම්බන්ධන්ට සහතිකවීමක් කර ඇත. මේ ගැන තවදුරටත් සාකච්ඡා සඳහා **TNA** කණ්ඩායමට නවදිල්ලියට ආරාධනාවක් ද කර තිබේ.

මෙහිදී 1987 ජූලි මාසයේ එදා ශ්‍රීලංකාවේ තිබූ වාතාවරණය ඔබට මඳක් මතක් කරමි. ලුතිනන් ජෙනරාල් කොබ්බෑකඩුව ප්‍රමුඛ රණශූර හමුදා නායකත්වයක් යටතේ උතුරේ සිදුකළ වඩමරච්චි මෙහෙයුමේ දී කොටි ත්‍රස්තවාදීන් විනාශකරමින් ඉදිරියට ගිය ලංකා හමුදා සේනාංක යන්ට මහ කොටියා වන ප්‍රභාකරන් කොටුකරගන්නට තව දිනකට දෙකකට වඩා ඉතිරිව තිබුණේ නැත. මේ මොහොතේ ද්‍රවිඩ බලපෑම යටතේ ඉන්දියාව කළේ ඔහු අල්ලා ගන්නට නොදෙනු පිණිස ලංකාවට වක්‍රව තර්ජනයක් කරමින් ගුවනින් පැමිණ බලෙන් පරිප්පු දැමීය. ඒ ඉන්දියානු අත දැමීමේ හේතුවෙන් ප්‍රභාකරන් අල්ලා ගත නොහැකි විය. ඒ සමගම ඉන්දියන් හමුදා ලංකාවට ගෙන්වන්නට ජේආර්ට සිදුවිය.

දැන් මේ ඉන්දියාව යළිත් සූදානම්වන්නේ ඒ වැඩේටම නොවේද? අද අප ආරක්ෂක හමුදා කොටි ත්‍රස්තවාදීන් විනාශකරලීමේ අන්තිම තල්ලුවට සූදානම්වන මොහොතේ ඒ ගමන මොටකරලීමට මං සෙවීමට ආ ගමනක් බව පැහැදිලිය.

ඉන්දියාවට යළිත් අතපොවන්නට හේතු කීපයකි.

✻ රටේ සංවර්ධනය සඳහා අප දැන් වැඩි සම්බන්ධතා ගොඩනගාගෙන ඇත්තේ චීනය සහ මැලේසියාව සමග වන අතර, ත්‍රස්තවිරෝධී යුද්ධය සඳහා ආරක්ෂක පුහුණුව, යුද උපකරණ ආදිය සඳහා පකිස්ථානය සමගද වෙයි. අප ආරක්ෂක කටයුතු වලදී ඉන්දියාව බොහෝවිට මගහැරී අවස්ථා එමට ඇත. අපේ මේ නව මිතුරු සබඳතා ඉන්දියාව නුරුස්සයි.

✻ එසේම අද අපි එදා සිටියාට වඩා ඊනියා වර්ගවාදී ප්‍රශ්නය පැහැදිලිව අවබෝධකරගෙන සාර්ථකත්වය කරා ගෙනයෑමද ඉන්දියාවට තර්ජනයකි. විශේෂයෙන් ඉන්දියන් සාගරයේ **මහ බලවතා** හෙවත් **ලොකුඅයියා** භූමිකාව රඟපාන ඉන්දියාව වටෙන් ත්‍රිකෝණයක මුළු තුනේ පිහිටි චීනය, ශ්‍රීලංකාව හා පකිස්ථානය අතරේ ගොඩනැගෙන මේ මිතුරු සබඳතාව ඉන්දියාව තර්ජනයක් ලෙස දකිනවා ද වෙන්නට ඇත.

✻ ඉන්දියාව අභ්‍යන්තරයේ ද බලයේ සිටින මන්මෝහන් සිංලාගේ කොංග්‍රස් පක්ෂ සභාගය **(UPA)** තුළ ද දැන් ප්‍රශ්න මතුවෙමින් පවතී. එම සභාගය බිඳවැටෙන ලකුණු ද දැන් පෙනේ. එසේම ජාතිවාදී භාරතීය ජනතා පාටිය **(BJP)** ක්‍රමයෙන් ප්‍රබල වෙමින් පවතී. ඔවුන් කර්ණාටක ප්‍රාන්ත රාජ්‍යයේ ළඟදී පැවති අතුරු ඡන්දයකින් කොංග්‍රසය පරදවා බලයට පත්වීම මෙයට නිදසුනකි. ලබන වසර මුළදී නියමිත සමස්ථ ඉන්දීය මහඡන්දයකදී නැවත **BJP** බලයට එන තර්ජනයක් ද පවතී.

මෙවන් වාතාවරණයක් තුළ දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ඇතුළු ද්‍රවිඩ කණ්ඩායම්වල හිත දිනාගැනීමට කොන්ග්‍රස්කාරයින්ට අවශ්‍යව ඇත. මේ ඉහතකී කරුණු සියල්ල දැන් අපේ ප්‍රශ්නවලට අත පෙවීමට ඉන්දියාව කරන දැඟලිල්ලට මනා හේතූන් වෙති. නැතිව අපට ආදරයකට නොව ඉන්දියාව සිය ආත්මාර්ථය ඉටුකරගැනීමට බව පැහැදිලි ය.

මේවාට යට නොවී අප දැනට ඉන්නා ස්ථාවරයේම පිහිටා පැහැදිලිවම මේ දෙමළ කොටි ත්‍රස්තවාදයට එරෙහිව අප රටේ ජනතාවගේ පූර්ණ සහයෝගයෙන් අප යන මේ ගමන ඉදිරියටම ගෙන යා යුතුය. තමන්ගේ වැඩක් බලාගන්නා ලෙස ඉන්දියාවට තරයේ සහ හොඳට කට ඇර පැහැදිලිවම කිව යුතු ය.

එසේ නොකර වැනෙන්නට ගියොත් අප මෙහි මුලදී සඳහන් කළ පරිදි එය නිසැකවම නැවත වරක් අප විසින් ම **ඉල්ලාගෙන පරිප්පු කෑමක්** වන බවට අපි අනතුරු හඟවමු!

♦ *සංජය විමලරත්න*

## කාරුණික හදැතියන්ගේ සංසදය



එංගලන්තයේ කාරුණික හදැතියන්ගේ සංසදය **The Kind Hearts Group in the UK** ශ්‍රීලංකාවේ නැගණහිර ප්‍රදේශයේ දරුවන්ට පෙර පාසැල් පිහිටුවීම සඳහා ආරම්භ කළ ලොතරැයියේ දිනුම් ඇදීම පසුගිය දා බර්මිංහැම් මහාවිහාරයේදී පැවැත්විණ. මේ එහි එක් අවස්ථාවකි.





Flying to Sri Lanka? Speak to us first...

Exclusive to Holiday Air!
December seat sale to Colombo

ROYAL JORDANIAN £405 + tax*

Traveling out of London:
11th Dec, 16th Dec & 23rd Dec
Returning to London - 1st week in Jan
Limited seats available
Hurry, book now to avoid disappointment

KUWAIT AIRWAYS £355 + tax**

SriLankan £478 + tax**

MCG IATA
020 8882 2626
www.holidayair.com
125-127 Bramley Road, Oakwood, London, N14 4UT